**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 21 ඡේදය අනුව වියදමක් ලෙස හඳුනාගත යුතු මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තු වියදම් රු.1,501,393ක් මෝටර් රථ ගිණුමට ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2023 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ගිණුමේ ශේෂය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ සිට මෙම තත්වය පුනරාවර්තන වියදම් යටතේ ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයෙහි දක්වා ඇති පරිදි වියදම නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 14 ඡේදය අනුව අධිකාරිය විසින් පුහුණු මධ්‍යස්ථාන ලෙස භාවිත කරනු ලබන ඉඩම් හා එම ඉඩම්වල ඉදිකරන ලද ගොඩනැගිලි 28 ක වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම් තක්සේරු කර ගිණුම් තැබීමට කටයුතු කරන බව | ආයතනයට අයත් සියලු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය අනුව ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට සෑම වර්ෂ තුනකට හෝ වර්ෂ පහකට වරක්වත් ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් අධිකාරිය විසින් ප්‍රත්‍යාගණන ආකෘතියට ගිණුම් තබා ඇති රු.6,098,701,187 ක වටිනාකමින් යුතු ඉඩම්, ගොඩනැගිලි හා මෝටර්රථ වර්ෂ 5 සිට වර්ෂ 15 දක්වා කාල පරිච්ඡේදයක් තුල ප්‍රත්‍යාගණනය සිදු කර නොතිබීම හේතුවෙන් එම වත්කම් පංති 03 හි සාධාරණ අගය නිරූපණය නොකෙරුණි. | මේ වන විට නැවත ප්‍රත්‍යාගණනය කටයුතු සිදුකරමින් සිටින අතර එය අවසන්වූ වහාම ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව වත්කම්හි සාධාරණ අගය නිරූපණය වන පරිදි ප්‍රත්‍යාගණනය කර ගිණුම් වල දැක්විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ පාඨමාලා ආදායම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණනයේදී පුහුණු මධ්‍යස්ථාන 05ක 2023 වර්ෂයේදී ආරම්භ කරන ලද පාඨමාලා 43කින් ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ රු.6,952,728ක ආදායම විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා විලම්භිත ආදායම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී පාඨමාලා ගාස්තු අදාල කාලපරිච්ජේදයට අනුව ගිණුම්ගත කිරිමට දිස්ත්‍රික් හා ජාතික පුහුණු මධ්‍යස්ථාන වලට දැනුම් දී ඇතිබව. | වර්ෂයට අදාල ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගණනය කිරීමේදී එක් එක් සේවකයන් සේවයට බැඳුනු දිනය පදනම් කරගෙන නොතිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු.26,046,767 ක් අඩුවෙන් හා සමුච්චිත අරමුදල එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන පසුව එම සේවකයන් ස්ථිර කිරීම් වලදී පත්වීම් දිනය ලෙස සේවය ස්ථිර කරන ලද දිනය ගැනීම නිසා මෙම ගැටලුව සිදුවී ඇති බව හා මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදි නිවැරදි දත්ත පදනම් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 මැයි 25 දින ආරම්භ කර තිබූ රු.මිලියන 48 ක ස්ථාවර තැන්පතුවට අදාල පොලී ආදායම උපචිත පදනම මත ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.124,695 කින්ද සමුච්චිත අතිරික්තය රු.4,923,568 කින් හා ලැබිය යුතු පොලී ආදායම රු.5,048,263 කින් ද අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර තැන්පත් පොලී ආදායම් උපචිත පදනම මත ගිණුම් තැබිමට කටයුතු කරන බව. | වර්ෂයට අදාලව මුදලින් ලද ආදායම් සහ ලැබියයුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළයුතුය. |
| (ඈ) | අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථානවල 2023 වර්ෂයේදී භාණ්ඩ සොරකමකට අදාලව සිදු වී තිබූ රු.7,127,888ක අලාභය ආරක්ෂක සේවා සපයන ආයතනයෙන් ගෙවීමට එකඟවී තිබීම නිසා ලැබිය යුතු ලෙස දැක්වීම වෙනුවට ආරක්ෂක සේවා වියදමින් අඩුකර දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මෙවැනි අලාභයන් ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල වියදම හා අලාභය නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුලින් පෙන්නුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | Skill for Inclusive Growth ( SFIG ) ව්‍යාපෘතිය මගින් අහංගම හා කදුරුවල පුහුණු මධ්‍යස්ථාන සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ රු.65,170,697 ක පුහුණු උපකරණ හා රු.4,540,165 ක් වටිනා පුහුණු ද්‍රව්‍ය ද 2022 වර්ෂයේදී ලැබී තිබූ රු.1,777,500 ක මාධ්‍ය උපකරණ ද ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් වල ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2023 වර්ෂයේදී උපදේශකවරුන්ට දීමනා ගෙවීම වෙනුවෙන් රු.107,323,495 ක් පමණක් අමාත්‍යාංශයෙන් ලැබී තිබියදී මූල්‍ය ප්‍රකාශනවල රු.117,168,560 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා වියදම රු.9,845,065 ක් වැඩියෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි. | අතපසු වීමකින් 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 දිනට ලැබුණු 9,845,065ක මුදලද 2023 වර්ෂයේ ලැබීමක් ලෙස සටහන් වීමෙන් මෙම වෙනස සිදුවී ඇති බව. | වර්ෂයට අදාල ආදායම් සහ වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (උ) | 2023- 2027 සංයුක්ත සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් උපදේශක ආයතනයකට ගෙවීම සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු.1,000,000 ක මුදල ලැබීම් හා ගෙවීම් එකම ගිණුමක් තුලින් සිදුකර තිබීම හේතුවෙන් අදාල වියදම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් වී නොතිබුණි. | මෙය ගිණුම්ගත කිරීමේදී වැරදීමකින් ලැබීම් හා ගෙවීම් එකම ගිණුමක සටහන් වී ඇති බව. | ලැබීම් හා ගෙවීම් වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි ආකාරයෙන් ගිණුම් ගත කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පාඨමාලා ගාස්තු ගිණුමේ රු.39,205,296 ක් වූ ශේෂය වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාලයක සිට පැවත එන ශේෂ රු.7,628,756 ක් වූ අතර එම ශේෂ අය කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් යටතේ පාඨමාලා හැදෑරූ ආධුනිකයින්ගෙන් ලැබිය යුතු මුදල් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය එකඟ වී ඇති අතර අනෙකුත් පාඨමාලා ගාස්තු බොහොමයක් මේ වන විට අය කර ගෙන ඇති බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.677,908,091 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.361,681,911 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.316,226,180 ක තවදුරටත් පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් මෙහෙයුම් වියදම්වල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය හා වෙනත් ආයතන මගින් විවිධ කාර්යයන් සඳහා වර්ෂ 2019 සිට 2022 දක්වා අධිකාරිය වෙත ලබා දී තිබූ රු.38,998,981 ක් අදාල කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව මෙම වාර්තාවේ දිනය වන විටත් බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යව රඳවා ගෙන තිබුණි. | මෝටර් කාර්මික පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයන්ගෙන් රු.මි.27ක් ඉතිරි වීමට ප්‍රධාන හේතුව කොවිඩ් 19 වසංගත තත්වය හා භාණ්ඩ ආනයනය සීමා වීම බව. | නිශ්චිත කාර්යයක් වෙනුවෙන් ලද මුදල් එම වර්ෂය තුලදීම අදාල කාර්යය සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පූර්ණ (සියයට 100ක) කොටස් අයිතිය සහිතව 2013 දෙසැම්බර් 18 දින කැබිනට් අනුමැතියක් රහිතව අධිකාරියේ අරමුදල් වලින් VTA Holdings Ltd නමින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචිකර තිබූ සමාගම ඈවර කිරීමට අවශ්‍ය ලේඛන 2022 ජූනි 20 දින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත භාර දීමට කටයුතු කර තිබුණි. සමාගමේ බැංකු ගිණුම් හා මෙහෙයුම් කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් ලබා දී තිබුණද එම වාර්තාව 2023 ජූලි 20 දින වන විටද සකස්කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි VTA Holding ගිණුම් කටයුතු සිදු කළ S&A Consultants PVT Ltd වෙත ඈවර කිරීම සඳහා දැනුම් දෙන ලෙසත් එම ආයතනයෙන් පිළිතුරක් නොලද හොත් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා ඈවර කිරීම් කටයුතු සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බව. | මෙහෙයුම් කටයුතු පිළිබඳව වාර්ථාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හම්බන්තොට මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද වැඩහල් ගොඩනැගිල්ල සඳහා රු.19,053,095 ක් වැයකිරීමෙන් පසුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2015 ජනවාරි 05 දින සිට ඉදිකිරීම් අත්හිටුවා තිබුණද කොන්ත්‍රාත්කරුට විරුද්ධව අවශ්‍ය | NBRO ආයතනය සමඟ මිරිජ්ජවිල වෘත්තීය පුහුණු වැඩහල් ගොඩනැගිල්ල පරීක්ෂා කර තත්ත්ව වාර්තාවක් පිළියෙල කිරීම සඳහා කළයුතු පරීක්ෂාවන් ඇතුළත් වාර්තාවක් අධිකාරිය වෙත ලබාදෙනු ලබන අතර ඒ වාර්තාව අනුව ඉදිරි කටයුතු කරනු | වැය කරන ලද මුදල් ඵලදායී ලෙස උපයෝජනය වන ලෙසට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාමාර්ග ගැනීමට යොමු වී නොතිබුණු අතර අතරමඟ නවතා ඇති ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැගිල්ල 2023 වර්ෂය අවසන් වන විටද භාවිත තත්ත්වයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලබන බව | |
| (ආ) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගාස්තු අයකිරීමට අනුමැතිය ලබා දී නොතිබුණු පූර්ණ කාලීන පාඨමාලා 16 කින් සමාලෝචිත වර්ෂයේ දී රු.19,003,930 ක් පාඨමාලා ගාස්තු ලෙස අයකර තිබුණි. | පරිපාලන හේතූන් මත සිදු වී ඇති අඩුපාඩු හෝ වෙනස්වීම් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව අනුමත කරන ලද පාඨමාලා වලින් පමණක් පාඨමාලා ගාස්තු අය කිරීම සිදු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතු වාහන අළුත්වැඩියා කිරීම හා වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන සිසුන් සඳහා රැකියාගත පුහුණුව ලබාදීමේ අරමුණ ඇතිව අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට පවත්වාගෙන තිබුණු වාහන නඩත්තු ඒකකය ආයතනයේ කාර්යසාධනයට ඵලදායී ලෙස දායක වී තිබුණි. එහෙත් විවිධ හේතු මත 2018 දෙසැම්බර් 31 දින සිට විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව වසාදමා තිබූ අතර මෙම ඒකකය සතුව තිබූ උපකරණ භාවිතා කිරීමෙන් තොරව මෝටර් රථ කාර්මික අංශයේ ගබඩා කර තිබුණි. | එහි පරිපාලන කටයුතු සහ අධීක්ෂණ කටයුතු විධිමත් අභ්‍යන්තර පරිපාලනයක් සහිතව පවත්වාගෙන යෑම සඳහා සුදුසු නිලධාරී මඩුල්ළකගේ සහභාගීත්වයක් නොවුණ බැවින් තාවකාලිකව නඩත්තු ඒකකය වසා දමන ලද බව. | පරිපාලන ගැටළු විසඳගෙන වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2010 වර්ෂයේ දී රු.5,823,000 ක් වැයකර මිලදීගෙන තිබූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හේනකඩුව වෙලේවත්ත පිහිටි රූඩ් 02 පර්චස් 33.5 ක ඉඩම හා 2017 වර්ෂයේදී රු.34,030,346 ක් වැයකර දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගත් පානදුර මෝදරවිල පිහිටි අක්කර 01 කින් යුත් ඉඩම් 2023 වර්ෂය වන විටත් වෘත්තීය පුහුණුව සඳහා ඵලදායීව භාවිතා කිරීමකින් තොරව පැවතුණි. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ආධුනිකයින් සඳහා බාහිර ක්‍රියාකාරකම් සහ දෛනික ක්‍රියාකාරම් සඳහා ඵලදායීව යොදා ගෙන ඇත.<br>පානදුර මෝදරවිල නව මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අදාළ සැළසුම් සකස් කර ආංශික නිපුනතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මුදල් ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2020 වසරේ පැවති වසංගත තත්වය හේතුවෙන් එය ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකරන ලද බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබාගැනීමට කටයුතු නොකර 2017 වර්ෂයේදී කුච්චවේලි හෝටල් පාසලේ ආධුනිකයින් 52 දෙනෙකුට නවාතැන් | ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය මඟින් ස්ථිර ජල සැපයුමක් ලබා දෙන තෙක් බවුසර් මඟින් මධ්‍යස්ථානයට අවශ්‍ය ජල පහසුකම් ලබා දීමේ එකඟතාවය මත මෙම මධ්‍යස්ථානය ආරම්භ කල බව. | ස්ථිර ජල සැපයුමක් ලබා ගෙන ආධුනිකයන්ගේ නේවාසිකාගාර |

| | | |
|---|---|---|
| ලබාදිය හැකි අංග සම්පූර්ණ කාමර 12 කින් සමන්විත දෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් රු.මිලියන 140.21 ක් වැයකර ඉදිකර තිබුණද එම වර්ෂයේ සිට මේ දක්වාම ස්ථිර ජල සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ආධුනිකයන්ගේ නේවාසිකාගාර ලෙස භාවිතා කිරීමට නොහැකිවී තිබුණි. | | ලෙස භාවිතා කිරීමට කටයුතු කල යුතුයි. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා සනීපාරක්ෂක සේවාව ප්‍රසම්පාදනයේදී නියමිත දිනයට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු නොකර පසුගිය වර්ෂ 02 හි කොන්ත්‍රාත්තුව පවරා තිබූ දෙවන අවම මිල ඉදිරිපත් කර තිබූ සැපයුම්කරුටම කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් අධිකාරියට රු.2,038,700 ක පාඩුවක් සිදු වී තිබුණි. | අදාළ ලංසු ලේඛන සියල්ල අධ්‍යයනය කර අවසන් කිරීමට නව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපතිවරයාට කාලය ප්‍රමාණවත් නොවූ බව | ප්‍රසම්පාදන කාර්යයන් විධිමත්ව ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කාර්යයන් 12 ක් සමාලෝචිත වර්ෂය තුලදී ඉටු කරගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණු අතර කාර්යයන් 03 ක ඉටුකරගැනීමේ භෞතික ප්‍රගතිය සියයට 3 ත් සියයට 38 ත් අතර විය. | නව e QMS හඳුන්වා දීමට යෝජිත බැවින් පවතින පද්ධතිය වෙනුවෙන් මුදල් වෙන් නොකිරීම, රාජ්‍ය වියදම් සීමා කිරීම, අනධ්‍යයන කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන් පැවැත් වීමට නොහැකි වීම හා 2023 වර්ෂයේ අපේක්ෂිත උපදේශක තනතුරු බඳවා ගැනීමට නොහැකි වීම හේතුවූ බව | ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් වර්ෂය තුළ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |